# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,052 — 1962 අප්‍රේල් 27 වැනි සිකුරාද — 1962.4.27**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලද)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 646 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 643 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 643 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 644 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 647 |
| | | "පුරාබද්ධ ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 156**

අංකය සී. 22/රෙක් ව්/40.

**රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

1962 මැයි 1 වැනි දින සිට රාජකීය ලංකා නාවික හමුදාවේ ලසිතන් ඇම්. සී. ගවුදර්.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

මො. වී. ජේ. අබයකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ
වැඩ බලන සහිර ලේකම්.

1962 අප්‍රේල් මස 12 වෙනි දා,
කොළඹ දී ය.

4-666

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 157**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 11/48.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 13 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8889/පී දරණ නඩුවේ තීන්දුව දීමට හා කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8328/පී සහ 6996/පී දරණ නඩු අවසාන වනතුරු ඇසීමට හා තීන්දු දීමට හා 1962 අප්‍රේල් 16 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8647/පී සහ 9426/පී දරණ නඩු අවසාන වන තුරු ඇසීමට හා තීන්දු දීමට, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 21/48.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මැයි 11 වැනි දින සිට, ගම්පොල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 1029 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත්

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ධුරයට හා ගම්පොල ක්‍රියා කරන පිණිස, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67/48.

එස්. තම්බි දුරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1962 අප්‍රේල් 12 වැනි දින සිට 25 වැනි දින දක්වා, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 56ඒ/57.

ඊ. එස්. සාලි මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. ඒ. ටී. මීගම මහතා 1962 අප්‍රේල් 10 වැනි දින සිට, පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 57ඒ/59.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 අප්‍රේල් 14 වැනි දින සිට 18 වැනි දින දක්වා, ගම්පොල ක්‍රියා කරන පිණිස, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 40ඒ/60(1).

ඩී. එල්. ඊ. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 මැයි 12 වැනි හා 17 වැනි දිනයන්හි, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 40ඒ/60.

ඩී. එල්. ඊ. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 මැයි 11 වැනි දින සිට 21 වැනි දින දක්වා, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 51ඒ/54.

ඊ. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උඳලාගම මහතා 1962 අප්‍රේල් 16 වැනි දින සිට 18 වැනි දින දක්වා, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68ඩී/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. රත්නසිංහම් මහතා 1962 අප්‍රේල් 28 වැනි දින, පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 අප්‍රේල් 21 වැනි දින සිට 26 වැනි දින දක්වා හා 28 වැනි දින සිට 1962 මැයි 4 වැනි දින දක්වා හා නැවතත් 1962 මැයි 5 වැනි දින සිට 9 වැනි දින දක්වා, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : වීඑල්/ආර්. 4/50.

එස්. ඊ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. රාසසියා මහතා 1962 අප්‍රේල් 17 වැනි දින සිට 19 වැනි දින දක්වා යාපන දිස්ත්‍රික්කයේ දූපත් හා බටහිර වලිකාමම් ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : වීඒඒ. මිශ්‍ර/57.

ඩී. පී. බී. මහදිවුල්වැව මහතා 1962 අප්‍රේල් 17 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු නුරුළු පළාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කලාගම් පළාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : වීඒඒ. මිශ්‍ර/57.

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා 1962 අප්‍රේල් 18 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු නුරුළු පළාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කලාගම් පළාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 1/48.

එල්. ඒ. පී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ජයසිංහ මහතා 1962 අප්‍රේල් 19 වැනි හා 21 වැනි දිනයන්හි, ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ බටහිර සියනෑ කෝරළේ (මැදපත්තුවේ) සහ හාපිටිගම් කෝරළේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා අළුත් කුරු කෝරළේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අප්‍රේල් 17 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

4-701

---

# වෙනත් පත්කිරීම් ආදිය

## 1962 අංක 158

## ගැසට් නිවේදනයයි

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

අංකය : ඒ. අයි. 15/1/62.

1962 මාර්තු මස 29 වෙනි දින සිට, ස්ථිර පත්වීමක් කරන තුරු, පුත්තලම දිස්ත්‍රික්කයේ බත්තුළුඔය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් එම්. රාසලිංගම් මහතාද,

අංකය : අයිඑන් කුහ්/එල්. 6/1/62.

1962 අප්‍රේල් මස 1 වෙනි දින සිට, එච්. ඩී. ධම්රත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරළයේ පිටිගල, ඇල්පිටිය සහ ඕපාත යන විදාන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ජේ. පී. ගුරුසිංහ මහතාද,

අංකය : ඒ. අයි. 15/1/61.

1962 අප්‍රේල් මස 3 වෙනි දින සිට පුත්තලම් දිස්ත්‍රික්කයේ කිරිමැටියා පත්තුවේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් විදානගේ වන්නිහාමි මහතාද,

පත්කර ඇත්තේය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 17 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

4-823

---

## 1962 අංක 159

## ගැසට් නිවේදනයයි

අංකය : ජේ. 12/60.

1944 අංක 13 දරණ ආඥපණතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9,828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරණ ප්‍රකාශනයෙන් සංශෝධිත 1939 අංක 48 දරණ ළමයින් සහ තරුණ අය පිළිබඳ ආඥපණතේ 3 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1962 අප්‍රේල් මස 15 වෙනි දින සිට එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා එම මහතාගේ අනිකුත් රාජකාරි වලට අතිරේක වශයෙන්, ත්‍රිකුණාමලේ අධිකරණ කොට්ඨාශයේ ළමා උසාවි මහෙස්ත්‍රාත්වරයා ලෙස පත්කර ඇත්තේය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 අප්‍රියෙල් මස 15 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

4-822

**1962 අංක 160**

## ගැසට් නිවේදනයයි

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින් :—

1. ඒ. ජී. හින්නි අප්පුහාමි මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
2. එස්. පී. එස්. වෛද්‍යසේකර මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
3. එච්. ජී. අප්පුනයිදේ මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,
4. එම්. යෝගලිංගම් මහතා පේදුරුතුඩුවේ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන සථිර ලේකම්.

1962 අප්‍රේල් මස 23 වැනි දින,
අධිකරණ අමාත්‍යාංශය.

4-824

---

**1962 අංක 161**

අංකය : ඊ බී/ඒ—258,

පහත සඳහන් පත්කිරීම් කිරීමට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා සතුටුවී ඇත :—

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර වැඩ බලන ආණ්ඩුවේ ඒජන්ත, ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න මහතා, ස්වකීය රාජකාරි වලට අතිරේකව, 1962 මාර්තු මස 12 වැනි දින සිට නැවත නියෝගයක් කරන තුරු, පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන්, පැට්‍රෝල් ආඥාපණත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර ආණ්ඩුවේ ඒජන්ත, ඒ. බී. ඇල්කඩුව මහතා, අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බලන කාලය තුල, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 62. 3. 26 දින සිට 62. 4. 30 දක්වා හෝ නැවත නියෝගයක් කරන තුරු, අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන්, පැට්‍රෝල් ආඥාපණත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

යාපනය පාලන දිස්ත්‍රික්කය භාර වැඩ බලන ආණ්ඩුවේ ඒජන්ත වී. පී. විට්ටච්චි මහතා, ස්වකීය රාජකාරි වලට අතිරේකව, 1962 අප්‍රේල් මස 2 වැනි දින සිට, නැවත නියෝගයක් කරන තුරු, යාපනය පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥාපණත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

වී. එල්. වීරසිංහ,
ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් 11 වැනි දින,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

4-681

---

**1962 අංක 162**

## දැන්වීමයි

හප්පිටියේ අප්පුහාමිල්ලාගේ දෙන් පිලිප් තිලකරත්න (මීට පෙර හප්පිටියගේ දෙන් පිලිප් නම් දරූ) මහතා සියඹලාපේ වාසස්ථානය සහ කායභිලයද උඩුපිල අතුරු කායභිලයද ඇතුව ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ක්වූ අප්‍රේල් මස 9 දින,
කොළඹ දී ය.

4-789

---

**1962 අංක 163**

## දැන්වීමයි

දොන් එඩ්වින් ජයසිංහ මහතා රත්මලේ පදිංචියද අගලවත්තේ කායභිලයද ඇතුව, කළුතර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ක් වූ අප්‍රේල් මස 4 දින,
කොළඹ දී ය.

4-674

---

**1962 අංක 164**

## දැන්වීමයි

කච්චකඩුගේ ගාමිණී ප්‍රීති කරුණාතිලක (මීට ඉහතින් කච්චකඩුගේ ජේපින් ප්‍රනාන්දු කරුණාතිලක නම් දැරූ) මහතා වේයන්ගොඩ වාසස්ථානය සහ කායභිලය ඇතුව ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංකෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ක් වූ අප්‍රේල් මස 4 දින,
කොළඹ දී ය.

4-675

---

**1962 අංක 165**

## දැන්වීමයි

පොන්නුසාමි තංගරත්නම් මහතා හලාවත අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 9 වැනි දින,
කොළඹ දී ය.

4-639

---

**1962 අංක 166**

## දැන්වීමයි

ගාමිණී සුදත්ත මත්තේගෙදර මහතා කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

4-640

---

**1962 අංක 167**

## දැන්වීමයි

සේන ජයලාල් මද්දුම බණ්ඩාර විජය ගුණවර්ධන (මීට ඉහතින් සේනක රාල්ලාගේ මද්දුම බණ්ඩා නම් දැරූ) මහතා පැල්මඩුල්ලේ වාසස්ථානය සහ කායභිලය ඇතුව රත්නපුරය අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ක්වූ අප්‍රේල් මස 4 දින,
කොළඹ දී ය.

4-670

# ආණ්ඩුවේ නිවේදන

අංකය : ඊඩී/සීබී/735/1/6.

## 1961 කේ අංකය 65 දරණ මුදල් පනත

1961 කේ අංකය 65 දරණ මුදල් පනතේ අංකය 8 (ඩී) දරණ වගන්තියේ විධි විධානයන් අනුව හා එම පනතේ අංකය 8 (ජී) දරණ වගන්තියේ විධි විධානයන්ට යටත්ව මුදල් ඇමතිතුමා විසින්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැඩ බලන සථිර ලේකම් වී. එල්. වීරසිංහ මහතා, ඇම්. බී. ඊ., යථෝක්ත පනතේ අංකය 8 (ජේ) වගන්තිය යටතේ සිය අස්වීමේ පත්‍ර ඉදිරිපත් කර ඇති ඇස්. ඇස්. සී. ප්‍රනාන්දු මහතා, ඇම්. බී. ඊ., වෙනුවට, ලංකා බැංකුවේ අධ්‍යක්‍ෂවරයකු වශයෙන් 1962 කේ මාර්තු 30 වැනිද සිට පත් කරනු ලැබ සිටී.

හෙ. ජිනදස,
මුදල් අමාත්‍යාංශයේ වැඩ බලන
සථිර ලේකම්.

1962 අප්‍රේල් 18 වැනිද,
කොළඹදීය.

4-715

---

ඇල්.ඩී—බී. 175ඒ/29. පීඑන් 1599.

## පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත

පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ (432 වෙනි අධිකාරය) 9 වෙනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් පනවනු ලබන නියෝග.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 අප්‍රේල් මස 18 දින,
කොළඹදීය.

### නියෝග

1. 1928 පෙබරවාරි 24 වෙනි දින හා අංක 7,631 දරණ ගැසට් පත්‍රයෙහි (එහි ලා ව්‍යවස්ථා යනුවෙන් සඳහන් ව) පළ කරනු ලැබ, කලින් කල සංශෝධනය කරනු ලැබූ පාසැල් ගුරුවරුන් ගේ විශ්‍රාම වැටුප් නියෝග, එහි (ix) වෙනි ඡේදයෙහි 2 වෙනි නියෝගයෙහි, "පාසැල" යන වචනය වෙනුවට "පාසැල හෝ 1959 අගෝස්තු 7 වෙනි දින හා අංක 11,828 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ පිරිවෙන් සඳහා වූ නියෝග සංග්‍රහයේ 10 (1) වෙනි නියෝගය අනුව පත් කරනු ලැබූ පිරිවෙනක ප්‍රධානාචාර්‍යයී හෝ උපගුරු" යන වචන හා ඉලක්කම් යෙදීමෙන් මෙයින් වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ.

2. 1 වෙනි නියෝගය මගින් පාසැල් ගුරුවරුන් ගේ විශ්‍රාම වැටුප් නියෝගයන්හි කරනු ලැබූ සංශෝධන 1959 අගෝස්තු 7 වෙනි දින සිට ක්‍රියාත්මක විය යුතු අතර එදින සිට ක්‍රියාත්මක වී ඇතැයි ද සැලකිය යුතුය.

4-827

---

## 1961 අංක 3 දරණ අධිකරණ භාෂා පනත

### 2 වෙනි වගන්තිය යටතේ ආඥාවයි

1961 අංක 3 දරණ අධිකරණ භාෂා පනතේ 2 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර වැඩබලන අධිකරණ අමාත්‍ය ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, අගමැතිවරියගේ අදහස් විමසා 1962 මැයි මස පළමුවන දින සිට, මෙහි උපලේඛනයෙහි නියමිත එක් එක් ගම්බද අධිකරණයෙහි වාර්තාගත උත්තරවාද සඳහාත්, නීති කටයුතු වාර්තාගත කිරීම සඳහාත් සිංහල භාවිතා කළ යුතුයයි මෙයින් නියම කරමි.

ඒ. පී. ජයසූරිය,
වැඩබලන අධිකරණ අමාත්‍ය.

1962 අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ.

### උපලේඛනය

**මතුගම ගම්බද උසාවිය සහ වලගෙදර, මහගම බෙල්ලන සහ පසියාගල සංචාරක උසාවි**

1. (811 සිට 825 දක්වාද, 826 සිට 850 දක්වාද වූ ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ සහිතව) පස්දුන් කෝරලේ නැගෙනහිරද (771 සිට 793අ සහ 794 සිට 810 දක්වාවූ ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ සහිතව) පස්දුන් කෝරලේ බටහිරද (714 සිට 770 දක්වාවූ ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ සහිතව) කළුතර තොටමුණ යන ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශවලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

**අම්බලන්ගොඩ ගම්බද උසාවිය සහ වේරගොඩ හික්කඩුව, බෙන්තොට, කොස්ගොඩ සහ ඇල්පිටිය සංචාරක උසාවි**

2. (42 සිට 50 දක්වාවූ ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ අත්හැර) වැල්ලබඩ පත්තුව (2 සිට 14, 15 සිට 24 දක්වාවූද 25 සිට 38, 39 සිට 41 දක්වාවූද 94 සිට 94අ දක්වාවූද ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ සහිතව) බෙන්තොට වලල්ලාවිටි කෝරළේ ද යන ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශ වලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

**අම්බලන්තොට ගම්බද උසාවිය සහ අන්ගුණුකොළපැලැස්ස මිද්දෙනිය, හම්බන්තොට, තිස්සමහාරාම සහ රන්න සංචාරක උසාවි**

3. (458, 462, 463, 538, 539, 543, 544, 546 සිට 557 දක්වාවූද 559, 561 සිට 564 සහ 567 සිට 583 දක්වාවූ ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ සහිතව) ගිරුවා පත්තු නැගෙනහිරද (584 සිට 589, 592, 592අ, 593, 595 සිට 604, 606 සහ 607 දක්වාවූ ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ සහිතව) මාගම්පත්තුවද (458, 462 සහ 463 දක්වාවූ ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ සහිතව) ගිරුවා පත්තු බස්නාහිරද යන ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශවලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

4-825

---

## දැන්වීමයි

රත්නපුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් සැල්වෙෝර් ජෝශප් ක්ෂේවියර් ඇක්විනාස් ප්‍රනාන්දු මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අවසර දී තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 9 වැනි දින,
කොළඹ දී ය.

4-638

---

## දැන්වීමයි

ත්‍රිකුණාමලය අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් වේලුපිල්ලෙයි කන්දසාමි මුදලි මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු කර්මාන්ත සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ක්වූ අප්‍රේල් මස 4 දින,
කොළඹ දී ය.

4-677

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

ගුදිරි කොහු සහ ඇටකෙ කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ඇස්. ජී. එච්. ෂොක්මන් මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩි පාලක සභා ආඥා පනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් ඇස්. ඒ. සුරසේන මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
වැඩ බලන සථිර ලේකම්වරයා.

1962 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ දී ය.

4-717

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පඩිපාලක සභා ආඥාපනතේ (136 වෙනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :—

(1) අයිස් සහ සිසිල් බීම සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට, පඩිපාලක සභා ආඥාපනතේ 12 (2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූවා සේ සැලකෙන, ඇම්. මුතුක්‍රිෂ්ණා මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු වශයෙන් පෙනී සිටීමට ඩී. ඒ. එමානුවෙල් මහතා සහ

(2) අයිස් සහ සිසිල් බීම සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට පඩිපාලක සභා ආඥාපනතේ 12 (2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූවා සේ සැලකෙන, දොස්තර ඩබ්ලිව්. ඩී. ද සිල්වා මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයෙකු වශයෙන් පෙනී සිටීමට, පී. ලංකා පෙරේරා මහතා.

සී. බී. කුමාරසිංහ,
වැ. බ. ස්ථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශය.

1962 අප්‍රියෙල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

4-642

---

## කෘෂි ද්‍රව්‍ය (පාලන) මණ්ඩලය

වර්ෂ 1939, අංක 29 දරන කෘෂි ද්‍රව්‍ය පාලන ආඥාපනතේ 161 වෙනි ශීර්ෂයේ 3 (1) වෙනි වගන්තිය යටතේ ගරු වාණිජ, වෙළඳ, ආහාර හා නැව් ඇමති තුමා විසින් පහත සඳහන් නිලධාරීන් 1962 මාර්තු 2 වෙනි දින සිට තුන් අවුරුදු කාල සීමාවකට කෘෂි ද්‍රව්‍ය පාලන මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත් කරන බැව් මෙයින් දැනුම් දෙමි :—

1. ගොවිජන සේවා කොමසාරිස් තැන,
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් තැන හා සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන,
3. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන,
4. ආහාර කොමසාරිස් තැන හා
5. ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ ගරු ලේකම් තැන.

කේ. අල්වාපිල්ලෙයි,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962. 4. 9 දා,
කොළඹදීය.

4-755

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කරච්චි තුනුක්කායි කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කිලිනොච්චි පරන්තන් ගම්පති කොට්ඨාශවල පරන්තන් ගමේ ගවයින් අතර, "ඇන්ත්‍රැක්ස්" නමැති රෝගය පැතිරී යන බැව් 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962 මාර්තු 16 දින අංක 12,986 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 අප්‍රේල් මස 21 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේ දීය.

4-765/1



උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කරච්චි තුන්කායි කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කිලිනොච්චි ඩී 5 ගමේ ගවයින් අතර, "ඇන්ත්‍රැක්ස්" නමැති රෝගය පැතිරී යන බැව් 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1961.2.17 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 අප්‍රේල් මස 21 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේ දීය.

4-765/2

---

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ යගම්පත්තා කෝරලේ දුම්මල සූරිය පළාතේ සියඹලා ගස් රුප්පේ, ගවයින් අතර, මුව සහ කුර නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962 මාර්තු 16 දින අංක 12,986 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 අප්‍රේල් 21 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේ දී ය.

4-758

---

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ හලාවත කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ තඹගල්ල ගම්පති කොට්ඨාශයේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962 ජනවාරි 12 දින අංක 12,875 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 අප්‍රේල් 21 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේ දී ය.

4-759

---

අංකය : ඩබ්ලිව්. ඇල්/සී 70.

### නිවේදනයයි

**වනසත්ව හා දුර්ලභ වෘක්ෂලතා කායනීලය**

වන සතුන් ගැබ් දරණ සමය—1962

අප්‍රේල් මස 30 වැනිදා සිට ඔක්තෝබර් මස 31 වැනිදා දක්වා වන සතුන් ගැබ් දරණ සමය වශයෙන් සලකනු ලැබේ.

මෙම තහනම් කාලය තුළ පහත දක්වන පක්ෂීන් හා මෘගයන් දඩයම් කිරීම, මැරීම, තුවාලකිරීම හෝ අල්වා ගැනීමතහනම්ය :—

**පක්ෂීන් :** මොනරා, හබන් කුකුළා, ඔලෙයියා, මා ඔලෙයියා, වලි කුකුළා, බෝලවටුවා, රන්වටුවා, කැස්වටුවා, රජවටුවා, සේරුවා හා මල්සේරුවා.

**මෘගයෝ :** ගෝනා, තිත් මුවා සහ ඕලු මුවා.

ඉහත සඳහන් කාලය තුළදී කිසිම අන්තර ප්‍රදේශයක මොනම සතෙක්වත් වෙඩි තැබීමට, මැරීමට හෝ ගෙනයාමට අවසර දෙනු නොලැබේ.

ඒ. ඇස්. ඒ. පකීර්,
වැඩබලන වනසත්ව භාරකාර තැන.

වනසත්වාරක්ෂක දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1962.4.16.

4-689

## අංක 9/62 දරන ආනයන පාලන දැන්වීම

**1961 දී වෙන් කළ ආනයන කොටස් වෙනුවෙන් නිකුත් කළ බලපත්‍ර**

1961 දී දෙන ලද වෙන් කිරීම් වෙනුවෙන් නිකුත් කරන ලදුව දැනට ඇති බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීම ගැන එවන අයැදුම් පත් සලකා බැලීම පිණිස 1962 මැයි 15 වැනි දිනට පෙර මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතු බැව් ආනයනකයන්ට මෙයින් දන්වනු ලැබේ.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹදීය.

4-739

---

## අපනයන පාලක දැන්වීම අංක 4/62

**මෙරට නිෂ්පාදිත රෙදිපිළි අපනයනය**

"ලාංකික කරන ලද රටවලට" හැර අනිකුත් රටවලට මෙරට නිෂ්පාදිත සරොම්, කමිස සහ වෙනත් රෙදිපිළි අපනයනය සඳහා කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සංවර්ධන අංශයෙහි කර්මාන්ත අධ්‍යක්ෂගේ නිර්දේශය උඩ මගේ මනාපය පරිදි දැන් බලපත්‍ර නිකුත් කරන බව අපනයනකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

"ලාංකික" කරන ලද රටවලට කෙරෙන අපනයනයන් සඳහා බලපත්‍ර නිකුත් කරනුයේ ලියා පදිංචි ලාංකික වෙළෙඳුන්ට පමණි. අපනයන පාලන කටයුතු සඳහා "ලාංකික" කරන ලද රටවල් නම්— ඇල්බේනියාව, ඔස්ට්‍රියාව, බල්ගේරියාව, චීනය, චෙකෝස්ලෝවැකියාව, ෆෝමෝසාව, හන්ගේරිය, කොරියාව, පෝලන්තය, රුමේනියාව, සෝවියට් සමාජවාදී සමූහආණ්ඩු සංගමය සහ වියට්නාමයයි.

බලපත්‍ර සඳහා අයදුම් පත් "කෑ" ආකෘති පත්‍රය පිටපත් 3 කින් සහ "කෑඒ" ආකෘති පත්‍රය පිටපත් 2 කින් යුක්ත කොට පිළියෙල කර කර්මාන්ත අධ්‍යක්ෂ මගින් මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

සී. මයිල්වාගනම්,
වැඩ බලන ආනයන හා අපනයන පාලක.

1962 අප්‍රියෙල් මස 18 වෙනි දින,
කොඹ දීය.

4-708

---

## රථ වාහන ගමනාගමනයට බාධා

**දකුණු කොළඹ දිස්ත්‍රික්කයේ පානදුර-කැස්බෑව මාර්ගයේ අංක 6/5 දරන පාලම**

ඉහත සඳහන් පාලම, අළුත්වැඩියා කිරීම සඳහා 62.4.23 වෙන දින සිට 62.5.6 වන දින දක්වා, රථ වාහන ගමනාගමනය කළ නොහැකි වන සේ වසා ඇති බැව් මහාජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

පලත්තොරුව-කිඳෙල්පිටිය මාර්ගය ඉහත සඳහන් මාර්ගය වෙනුවට යොදා ගත හැකිය.

වී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අප්‍රියෙල් මස 18 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කාර්යාලයේදීය.

4-706

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**වයඹ කොට්ඨාශය** — **හලාවත දිස්ත්‍රික්කය**

### ඉහළ කොට්ටාරමුල්ල-නාරාවිල පාරේ අංක 1/6 දරණ පාලම සෑදීම

1962 පෙබ. 9 වැනි දින අංක 12,928 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීමට පසුවය.

2. ඉහත පාර සියලු රථ වාහනයන් සඳහා 1962 අප්‍රියෙල් 10 දින සිට විවෘතව පවතින බැව් මෙයින් නිවේදනය කරමි.

එස්. සිවසුබ්‍රමනියම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අප්‍රියෙල් මස 21 වැනි දා,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ දීය.

4-816

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**වයඹ කොට්ඨාශය** — **හලාවත දිස්ත්‍රික්කය**

### මාන්කුලම-කොක්කවිල පාරේ අංක 2/3 දරණ බෝක්කුව සෑදීම

1962 අප්‍රියෙල් මස 18 වැනි දින සිට දින 22 ක් මාන්කුලම-කොක්කවිල පාර සියලු රථ වාහනයන්ට වසා ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

මේ වෙනුවට යෝද ඇල-මහගම පාර, ඌරලියගම-පනිරෙන්ඩාවිලත්තව පාර සහ තඹගල්ල පාර පාවිච්චි කළ හැකිය.

එස්. සිවසුබ්‍රමනියම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අප්‍රියෙල් මස 21 වැනි දා,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ දීය.

4-813

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**වයඹ කොට්ඨාශය** — **හලාවත දිස්ත්‍රික්කය**

### මහවැව-පැනිහැලියගම පාර

1961 දෙසැ. 1 වැනි දින අංක 12,788 දරණ ආණ්ඩුවේ ගැසට් නිවේදනයට පසුවය.

ඉහත සඳහන් පාර සැහැල්ලු (ටො. 2 1/2) රථ වාහනයන්ට 1962 අප්‍රේල් 12 වැනි දා සිට විවෘතව පවතින බැව් මෙයින් නිවේදනය කරමි.

එස්. සිවසුබ්‍රමනියම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අප්‍රියෙල් මස 20 වැනි ද,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ දීය.

4-812

---

## විශෙෂ නිවේදනයයි

1962 මැයි මස 1 වෙනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1962 මැයි 4 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 අප්‍රේල් 28 වැනි සෙනසුරාදා දවල් 12ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 අප්‍රේල් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි